විශේෂ සටහන 10

## ප්‍රධාන ආර්ථික ප්‍රතිපත්තිමය වෙනස්වීම් සහ ක්‍රියාමාර්ග : 2014[1]

### මූර්ත අංශය[2]

2014 පෙබරවාරි 02 - ග්‍රෑම් 400 සම්පූර්ණ යොදය සහිත කිරිපිටි පැකට්ටුවක උපරිම සිල්ලර මිල රුපියල් 386 දක්වා රුපියල් 61 කින් ද කිලෝග්‍රෑම් 1 සම්පූර්ණ යොදය සහිත කිරිපිටි පැකට්ටුවක මිල රුපියල් 962 දක්වා රුපියල් 152 කින් ද වැඩිකරන ලදී.

2014 සැප්තැම්බර් 16 - ගෘහස්ථ පාරිභෝගිකයන් (D-1) සඳහා විදුලි ඒකකයක සාමාන්‍ය ගාස්තුව සියයට 25 කින් අඩු කරන ලද අතර, ඉන්ධන ගැලපුම් ගාස්තුව ඉවත් කරන ලදී. ඒ අනුව, එම කාණ්ඩය සඳහා අදාළ නව විදුලි ගාස්තු පහත පරිදි වේ.

| පරාසය | පරිභෝජනය (කිලෝවොට් පැය/මසකට) | බලශක්ති ගාස්තුව (රුපියල්/කිලෝවොට් පැය) | ස්ථාවර ගාස්තුව (රුපියල්/ මසකට) |
|---|---|---|---|
| මසකට ඒකක | 0-30 | 2.50 | 30.00 |
| 0-60 ත් අතර | 31-60 | 4.85 | 60.00 |
| මසකට ඒකක | 0-60 | 7.85 | අදාළ නොවේ |
| 60 ට වැඩි | 61-90 | 10.00 | 90.00 |
| | 91-120 | 27.75 | 480.00 |
| | 121-180 | 32.00 | 480.00 |
| | >180 | 45.00 | 540.00 |

2014 සැප්තැම්බර් 17 - ප්‍රධාන ඛනිජ තෙල් නිෂ්පාදනයන්හි සිල්ලර මිල ගණන් පහත පරිදි අඩු කරන ලදී.
- පෙට්‍රල් (ඔක්ටේන් 92) ලීටරයක මිල රුපියල් 157 දක්වා රුපියල් 5 කින්
- පෙට්‍රල් (ඔක්ටේන් 95) ලීටරයක මිල රුපියල් 165 දක්වා රුපියල් 5 කින්
- ඔටෝ ඩීසල් ලීටරයක මිල රුපියල් 118 දක්වා රුපියල් 3 කින්
- සුපර් ඩීසල් ලීටරයක මිල රුපියල් 140 දක්වා රුපියල් 5 කින්
- භූමිතෙල් ලීටරයක මිල රුපියල් 86 දක්වා රුපියල් 20 කින්

2014 ඔක්තෝබර් 10 - කිලෝග්‍රෑම් 12.5 ගෘහස්ථ එල්.පී.ගෑස් සිලින්ඩරයක මිල රුපියල් 2,146 දක්වා රුපියල් 250 කින් අඩු කරන ලදී.

2014 නොවැම්බර් 01 - ගෘහස්ථ පාරිභෝගිකයන්ගේ මසකට ජල ඒකක 25 ක් දක්වා පරිභෝජනය සඳහා වන ජල ගාස්තුව සියයට 10 කින් අඩු කරන ලදී.

2014 නොවැම්බර් 15 - මාසිකව විදුලි ඒකක 300 කට අඩුවෙන් පරිභෝජනය කරන 'කර්මාන්ත' හා 'පොදු සේවා' අංශ සඳහා විදුලි ඒකකයක සාමාන්‍ය ගාස්තුව සියයට 25 කින් අඩු කරන ලදී.

- මාසිකව විදුලි ඒකක 300 කට වැඩියෙන් පරිභෝජනය කරන 'කර්මාන්ත' හා 'පොදු සේවා' අංශ සඳහා විදුලි ඒකකයක සාමාන්‍ය ගාස්තුව සියයට 15 කින් අඩු කරන ලදී.
- 'හෝටල්' අංශයේ විදුලි ඒකකයක සාමාන්‍ය ගාස්තුව සියයට 15 කින් අඩු කරන ලදී.

2014 දෙසැම්බර් 06 - ප්‍රධාන ඛනිජ තෙල් නිෂ්පාදනයන්හි සිල්ලර මිල ගණන් පහත පරිදි අඩු කරන ලදී.
- පෙට්‍රල් (ඔක්ටේන් 92) ලීටරයක මිල රුපියල් 150 දක්වා රුපියල් 7 කින්
- පෙට්‍රල් (ඔක්ටේන් 95) ලීටරයක මිල රුපියල් 158 දක්වා රුපියල් 7 කින්
- ඔටෝ ඩීසල් ලීටරයක මිල රුපියල් 111 දක්වා රුපියල් 7 කින්
- සුපර් ඩීසල් ලීටරයක මිල රුපියල් 133 දක්වා රුපියල් 7 කින්

1 2014 වසර තුළ දී මෙන්ම 2015 වසරේ පළමු මාස 3 තුළ දී ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන ආර්ථික ප්‍රතිපත්තිමය වෙනස්වීම් සහ ක්‍රියාමාර්ග සහ නුදුරු අනාගතයේ දී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ද මීට ඇතුළත් වේ.

2 මූර්ත අංශය සංවර්ධනය සඳහා ලබා දුන් රාජ්‍ය මූල්‍ය දිරිගැන්වීම් පිළිබඳ විස්තර රාජ්‍ය මූල්‍ය අංශයේ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගවල ඇතුළත් වේ.

| | |
|---|---|
| | - භූමිතෙල් ලීටරයක මිල රුපියල් 81 දක්වා රුපියල් 5 කින් |
| | - කර්මාන්ත සඳහා භාවිතා කරන භූමිතෙල් ලීටරයක මිල රුපියල් 110 දක්වා රුපියල් 5 කින් |
| 2014 දෙසැම්බර් 07 | - කිලෝග්‍රෑම් 12.5 ගෘහස්ථ එල්.පී.ගෑස් සිලින්ඩරයක මිල රුපියල් 1,896 දක්වා රුපියල් 250 කින් අඩු කරන ලදී. |
| 2015 ජනවාරි 22 | - ප්‍රධාන ඛනිජ තෙල් නිෂ්පාදනයන්හි සිල්ලර මිල ගණන් පහත පරිදි අඩු කරන ලදී.<br>- පෙට්‍රල් (ඔක්ටේන් 92) ලීටරයක මිල රුපියල් 117 දක්වා රුපියල් 33 කින්<br>- පෙට්‍රල් (ඔක්ටේන් 95) ලීටරයක මිල රුපියල් 128 දක්වා රුපියල් 30 කින්<br>- ඔටෝ ඩීසල් ලීටරයක මිල රුපියල් 95 දක්වා රුපියල් 16 කින්<br>- සුපර් ඩීසල් ලීටරයක මිල රුපියල් 110 දක්වා රුපියල් 23 කින්<br>- භූමිතෙල් ලීටරයක මිල රුපියල් 65 දක්වා රුපියල් 16 කින්<br>- කර්මාන්ත සඳහා භාවිතා කරන භූමිතෙල් ලීටරයක මිල රුපියල් 94 දක්වා රුපියල් 16 කින් |
| 2015 ජනවාරි 30 | - භූමිතෙල් ලීටරයක් සඳහා වන සිල්ලර මිල රුපියල් 59 දක්වා රුපියල් 6 කින් අඩු කරන ලදී.<br>- කිලෝග්‍රෑම් 12.5 ගෘහස්ථ එල්.පී.ගෑස් සිලින්ඩරයක මිල රුපියල් 1,596 දක්වා රුපියල් 300 කින් අඩු කරන ලදී. |
| 2015 පෙබරවාරි 01 | - මගී බස් ගාස්තු සියයට 8.2 ක සාමාන්‍ය ප්‍රතිශතයකින් අඩු කරන ලදී. |
| 2015 පෙබරවාරි 20 | - අයිතම කිහිපයක් සඳහා වන උපරිම සිල්ලර මිල පහත පරිදි පනවන ලදී.<br>- සාමාන්‍ය පෝට්ලන්ඩ් සිමෙන්ති, පෝට්ලන්ඩ් ලයිම්ස්ටෝන් සිමෙන්ති සහ මේසන් වැඩ සඳහා භාවිතා කරන සිමෙන්ති කිලෝග්‍රෑම් 50 ක බෑගයක් සඳහා රුපියල් 840<br>- සුදු සීනි (බහාලුම් රහිත) කිලෝග්‍රෑම් එකක් සඳහා රුපියල් 87<br>- සම්පූර්ණ යොදය සහිත කිරිපිටි ග්‍රෑම් 400 අසුරණයක් සඳහා රුපියල් 325 සහ කිලෝග්‍රෑම් 1 අසුරණයක් සඳහා රුපියල් 810<br>- සස්ටජන් ග්‍රෑම් 400 අසුරණයක් සඳහා රුපියල් 1,500<br>- තිරිඟු පිටි (බහාලුම් රහිත) කිලෝග්‍රෑම් 1 ක් සඳහා රුපියල් 87<br>- මුං ඇට කිලෝග්‍රෑම් 1 ක් සඳහා රුපියල් 265<br>- වියළි හාල්මැස්සන් (ආනයනික) කිලෝග්‍රෑම් 1 ක් සඳහා රුපියල් 385<br>- ටින් මාළු ශුද්ධ බර ග්‍රෑම් 425 ක හෝ දියර රහිත බර ග්‍රෑම් 280 ක් සඳහා රුපියල් 140 සහ ශුද්ධ බර ග්‍රෑම් 155 හෝ දියර රහිත ග්‍රෑම් 105 ක් සඳහා රුපියල් 70<br>- නොඇඹරූ හෝ කුඩු නොකළ කොත්තමල්ලි ඇට කිලෝග්‍රෑම් 1 ක් සඳහා රුපියල් 350<br>- උඳු කිලෝග්‍රෑම් 1 ක් සඳහා රුපියල් 300<br>- උම්බලකඩ කිලෝග්‍රෑම් 1 ක් සඳහා රුපියල් 1,740<br>- කුඩු කළ හෝ ඇඹරූ කහ කිලෝ එකක් සඳහා රුපියල් 800<br>- කුඩු කළ හෝ ඇඹරූ වියළි මිරිස් කිලෝග්‍රෑම් එකක් සඳහා රුපියල් 400 |

**විදේශ අංශය**

**වෙළඳ සහ තීරු බදු**

| | |
|---|---|
| 2014 ජනවාරි 21 | - රජය හෝ රජය විසින් අනුමත කරන ලද පර්යේෂණ හා අධ්‍යාපනික ආයතන, රෝහල් සහ රජයේ දෙපාර්තමේන්තු මගින් යොදා ගනු ලබන ස්ප්‍රීතු (ඊතයිල් මධ්‍යසාර) සඳහා බදු නිදහස ලබාදෙන ප්‍රමාණය මසකට ලීටර් 10,000 කට සීමා කරන ලදී. |
| 2014 පෙබරවාරි 03 | - කිරිපිටි ආනයනයේ දී ලබාදී තිබූ තීරුබදු අත්හැරීම කිලෝග්‍රෑමයට රුපියල් 18 සිට කිලෝග්‍රෑමයට රුපියල් 68 දක්වා වැඩි කරන ලදී. ඒ අනුව, කිරිපිටි සඳහා අදාළවන තීරුබදු අනුපාතය කිලෝග්‍රෑමයට රුපියල් 57 කි. |

| | |
|---|---|
| 2014 පෙබරවාරි 06 | - පියලි කළ මයිසූර් පරිප්පු ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස පහක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 22 සිට කිලෝග්‍රෑමයට රුපියල් 5 දක්වා අඩු කරන ලදී. |
| 2014 පෙබරවාරි 07 | - අර්තාපල් ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස පහක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 10 සිට කිලෝග්‍රෑමයට රුපියල් 25 දක්වා වැඩි කරන ලදී. |
| 2014 මාර්තු 08 | - සම්පූර්ණ (පියලි නොකළ) මයිසූර් පරිප්පු ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස පහක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 18 සිට කිලෝග්‍රෑමයට රුපියල් 10 දක්වා අඩු කරන ලදී. |
| 2014 මාර්තු 17 | - රතු ළූණු ආනයනය සඳහා වන කිලෝග්‍රෑමයට රුපියල් 5 ක් සහ බොම්බයි ළූණු ආනයනය සඳහා වන කිලෝග්‍රෑමයට රුපියල් 10 ක් වූ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස පහක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී. |
| 2014 අප්‍රේල් 09 | - සහල් ආනයනය සඳහා අය කළ කිලෝග්‍රෑමයට රුපියල් 20 ක් වූ තීරු බද්ද, සියයට 12 ක එකතු කළ අගය මත බද්ද, සියයට 2 ක ජාතිය ගොඩනැගීමේ බද්ද සහ සියයට 5 ක වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බද්ද වෙනුවට ඉදිරි මාස තුනක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 5 ක විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද හඳුන්වා දෙන ලදී. |
| 2014 අප්‍රේල් 10 | - ළදරු කිරිපිටි ආනයනය සඳහා සියයට 7.5 ක සම්පූර්ණ තීරු බදු අත්හැරීමක් ලබා දෙන ලදී. ඒ අනුව ආනයනික ළදරු කිරිපිටි සඳහා අදාළ වන තීරු බදු අනුපාතිකය සියයට 0 කි. |
| 2014 අප්‍රේල් 11 | - බඩ ඉරිඟු සහ ඉදල් ඉරිඟු ඇට (සෝගම්) ආනයනය සඳහා අය කළ සියයට 15 ක තීරු බද්ද, සියයට 12 ක එකතු කළ අගය මත බද්ද, සියයට 2 ක ජාතිය ගොඩනැගීමේ බද්ද, සියයට 5 ක වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බද්ද සහ සියයට 35 ක සෙස් බද්ද වෙනුවට ඉදිරි මාස දෙකක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයකට රුපියල් 10 ක විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක් හඳුන්වා දෙන ලදී. |
| 2014 මැයි 22 | - පහත සඳහන් ආහාර ද්‍රව්‍ය ආනයනය සඳහා විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද ඉදිරි මාස හතක කාලයකට අදාළ වන පරිදි අඩු කරන ලදී.<br>- අර්තාපල් කිලෝග්‍රෑමයට රුපියල් 25 සිට කිලෝග්‍රෑමයට රුපියල් 15 දක්වා<br>- සීනි කිලෝග්‍රෑමයට රුපියල් 30 සිට කිලෝග්‍රෑමයට රුපියල් 25 දක්වා<br>- අළුත් හෝ ශීත කළ මසුන්, උම්බලකඩ, වියළි හාල්මැස්සන්, කරවල, යෝගට්, බටර්, සුදුළූණු, මෑ වර්ගයේ ඇට, කොණ්ඩ කඩල, මුං ඇට, උඳු, කව්පි, අළුත් දොඩම්, මිදි, ඇපල්, මිරිස්, කොත්තමල්ලි බීජ, සුදුරු බීජ, මහදුරු බීජ, කහ, උළුහාල් ඇට, කුරක්කන්, කුරක්කන් පිටි, උඳු පිටි, පොතු හරින ලද රටකජු, අබ ඇට, එළවළු තෙල්, මාගරින්, ටින් කරන ලද මාළු සහ ලුණු සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද ඉදිරි මාස හතක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී. |
| 2014 මැයි 24 | - සම්පූර්ණ (පියලි නොකළ) මයිසූර් පරිප්පු ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හතක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 10 සිට කිලෝග්‍රෑමයට රුපියල් 5 දක්වා අඩු කරන ලදී.<br>- පියලි කළ මයිසූර් පරිප්පු ආනයනය සඳහා අය කළ කිලෝග්‍රෑමයට රුපියල් 5 ක් වූ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හතක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී. |
| 2014 ජූනි 02 | - කිරි පිටි ආනයනයේදී ලබා දී තිබූ තීරුබදු අත්හැරීම කිලෝග්‍රෑමයට රුපියල් 68 සිට කිලෝග්‍රෑමයට රුපියල් 43 දක්වා අඩු කරන ලදී. ඒ අනුව, කිරි පිටි සඳහා අදාළ වන තීරු බදු අනුපාතය කිලෝග්‍රෑමයට රුපියල් 82 කි. |
| 2014 ජූනි 11 | - බඩ ඉරිඟු සහ ඉදල් ඉරිඟු ඇට (සෝගම්) ආනයනය සඳහා අය කළ කිලෝග්‍රෑමයට රුපියල් 10 ක් වූ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද 2014 ජූලි 15 දින දක්වා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී. |
| 2014 ජූලි 09 | - සහල් ආනයනය සඳහා අය කළ කිලෝග්‍රෑමයට රුපියල් 5 ක් වූ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද ඉදිරි මාස පහක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී. |

| | |
|---|---|
| 2014 ජූලි 16 | - අර්තාපල් ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස තුනක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 15 සිට කිලෝග්‍රෑමයට රුපියල් 5 දක්වා අඩු කරන ලදී.<br>- සීනි ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස තුනක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයකට රුපියල් 25 සිට කිලෝග්‍රෑමයකට රුපියල් 28 දක්වා වැඩි කරන ලදී. |
| 2014 ජූලි 18 | - මැකරල් ආනයනය සඳහා වූ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද සියයට 10 ක් හෝ කිලෝග්‍රෑමයට රුපියල් 10 ක් යන දෙකෙන් වඩා වැඩි බදු ප්‍රමාණය ලෙස පැවති අතර එය මාස හතක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 10 ක් ලෙස සංශෝධනය කරන ලදී. |
| 2014 ජූලි 26 | - පහත සඳහන් ආහාර ද්‍රව්‍ය ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද ඉදිරි මාස තුනක කාලයක් සඳහා අදාළ වන පරිදි අඩු කරන ලදී.<br>  - සම්පූර්ණ (පියලි නොකළ) මෑ වර්ගයේ ඇට කිලෝග්‍රෑමයට රුපියල් 22 සිට කිලෝග්‍රෑමයට රුපියල් 15 දක්වා<br>  - පියලි කළ මෑ වර්ගයේ ඇට කිලෝග්‍රෑමයට රුපියල් 25 සිට කිලෝග්‍රෑමයට රුපියල් 18 දක්වා<br>  - සම්පූර්ණ කොණ්ඩ කඩල කිලෝග්‍රෑමයට රුපියල් 12 සිට කිලෝග්‍රෑමයට රුපියල් 7 දක්වා<br>  - පියලි කළ කොණ්ඩ කඩල කිලෝග්‍රෑමයට රුපියල් 15 සිට කිලෝග්‍රෑමයට රුපියල් 10 දක්වා<br>  - මුං ඇට කිලෝග්‍රෑමයට රුපියල් 102 සිට කිලෝග්‍රෑමයට රුපියල් 70 දක්වා<br>  - කව්පි කිලෝග්‍රෑමයට රුපියල් 100 සිට කිලෝග්‍රෑමයට රුපියල් 70 දක්වා<br>  - සම්පූර්ණ මයිසූර් රතු පරිප්පු කිලෝග්‍රෑමයට රුපියල් 5 සිට කිලෝග්‍රෑමයට රුපියල් 2 දක්වා<br>  - සම්පූර්ණ මයිසූර් කහ පරිප්පු කිලෝග්‍රෑමයට රුපියල් 5 සිට කිලෝග්‍රෑමයට රුපියල් 2 දක්වා<br>  - කුරක්කන් කිලෝග්‍රෑමයට රුපියල් 100 සිට කිලෝග්‍රෑමයට රුපියල් 70 දක්වා<br>- බඩ ඉරිඟු සහ ඉදල් ඉරිඟු ඇට (සෝගම්) ආනයනය සඳහා අය කළ කිලෝග්‍රෑමයට රුපියල් 10 ක් වූ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස තුනක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී.<br>- පියලි කළ මයිසූර් රතු පරිප්පු සහ පියලි කළ මයිසූර් කහ පරිප්පු ආනයනය සඳහා අය කළ කිලෝග්‍රෑමයට රුපියල් 5 ක් වූ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස තුනක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී. |
| 2014 අගෝස්තු 12 | - රතු ළූණු ආනයනය සඳහා අය කළ කිලෝග්‍රෑමයට රුපියල් 5 ක් වූ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හතරක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී.<br>- බොම්බයි ළූණු ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද ඉදිරි මාස හතරක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 10 සිට කිලෝග්‍රෑමයට රුපියල් 25 දක්වා වැඩිකරන ලදී. |
| 2014 අගෝස්තු 15 | - අර්තාපල් ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද ඉදිරි මාස හතරක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 5 සිට කිලෝග්‍රෑමයට රුපියල් 15 දක්වා වැඩි කරන ලදී. |
| 2014 අගෝස්තු 23 | - අර්තාපල් ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හතරක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 15 සිට කිලෝග්‍රෑමයට රුපියල් 40 දක්වා වැඩි කරන ලදී.<br>- බොම්බයි ළූණු ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හතරක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 25 සිට කිලෝග්‍රෑමයට රුපියල් 35 දක්වා වැඩි කරන ලදී. |
| 2014 සැප්තැම්බර් 05 | - සහල් ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස තුනක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 5 සිට කිලෝග්‍රෑමයට රුපියල් 1 දක්වා අඩු කරන ලදී. |

| | |
|---|---|
| | - සීනි ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස තුනක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 28 සිට කිලෝග්‍රෑමයට රුපියල් 33 දක්වා වැඩි කරන ලදී. |
| 2014 සැප්තැම්බර් 06 | - අළුත් හෝ ශීත කළ අර්තාපල් ආනයනය තහනම් කරන ලදී. |
| 2014 ඔක්තෝබර් 02 | - ශීර්ෂයේ කටු ගැලවූ මත්ස්‍ය සහ අනෙකුත් මත්ස්‍ය මස් හැර, අලුත් හෝ ශීත කළ මත්ස්‍ය ආනයනය තහනම් කරන ලදී. |
| 2014 ඔක්තෝබර් 09 | - කිරිපිටි ආනයනයේ දී ලබා දී තිබූ තීරුබදු අත්හැරීම ඉවත් කරන ලදී. ඒ අනුව, කිරිපිටි ආනයනය සඳහා අදාළ තීරු බදු අනුපාතය සියයට 25 හෝ කිලෝග්‍රෑමයට රුපියල් 125 කි. |
| 2014 ඔක්තෝබර් 10 | - සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෛද්‍ය සැපයුම් අංශය විසින් භාවිතා කරනු ලබන ස්ප්‍රීතු (ඊතයිල් මධ්‍යසාර) ආනයනය කිරීමේ දී හෝ දේශීයව සැපයීමේ දී මසකට ලීටර් 20,000 ක බදු නිදහස් සීමාවක් පනවන ලදී. |
| | - ශ්‍රී ලංකාව තුළ නිපදවනු ලබන ඉක්ෂුපාක, තල්, පොල් හා පදම් කළ අරක්කු, මෙරට සෑදූ විදේශීය ස්ප්‍රීතු සහ ධාන්‍ය මත්පැන් සඳහා වන සුරා බදු වැඩි කරන ලදී. |
| | - ශ්‍රී ලංකාවේ පිහිටුවා ඇති බලයලත් නිෂ්පාදනාගාරයක නිෂ්පාදනය කොට නිකුත් කරනු ලබන ධාන්‍ය මත්පැන් සඳහා වන සුරා බදු වැඩි කරන ලදී. |
| | - සිගරට් ආනයනය සඳහා වන නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බදු වැඩි කරන ලදී. |
| 2014 ඔක්තෝබර් 25 | - කිරිපිටි ආනයනය සඳහා අය කළ තීරු බද්ද කිලෝග්‍රෑමයට රුපියල් 125 සිට කිලෝග්‍රෑමයට රුපියල් 225 දක්වා වැඩි කරන ලද අතර, කිලෝග්‍රෑමයට රුපියල් 100 ක තීරු බදු අත්හැරීමක් ලබා දෙන ලදී. ඒ අනුව, කිරිපිටි ආනයනය සඳහා අදාළ වන බදු අනුපාතිකය කිලෝග්‍රෑමයට රුපියල් 125 කි. |
| | - මෑ වර්ගයේ ඇට, කොණ්ඩ කඩල, මුං ඇට, උඳු, කව්පි, මයිසූර් (රතු පරිප්පු), කහ පරිප්පු, බඩ ඉරිඟු, ඉදල් ඉරිඟු (සෝගම්) ඇට, කුරක්කන්, මිලට් සහ මාජරින් ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද ඉදිරි මාස හතරක කාලයක් සඳහා දීර්ඝ කරන ලදී. |
| | - තීරුබදු අත් පොතෙහි 87 වන පරිච්ඡේදය යටතේ වර්ගීකරණය කර ඇති මෝටර් වාහන සඳහා වන එකතු කළ අගය මත බද්ද, ජාතිය ගොඩනැගීමේ බද්ද, සෙස් බද්ද, තීරු බද්ද සහ වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බද්ද වෙනුවට නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බද්ද පනවන ලදී. |
| | - මධ්‍යසාර නිෂ්පාදනය සඳහා වන එකතු කළ අගය මත බද්ද සහ ජාතිය ගොඩනැගීමේ බද්ද වෙනුවට සුරා බද්ද පනවන ලදී. |
| | - මධ්‍යසාර ආනයනය සඳහා වන එකතු කළ අගය මත බද්ද සහ ජාතිය ගොඩනැගීමේ බද්ද වෙනුවට තීරුබදු සහ සෙස් බදු පනවන ලදී. |
| | - සිගරට් නිෂ්පාදනය හෝ ආනයනය සඳහා වන එකතු කළ අගය මත බද්ද සහ ජාතිය ගොඩනැගීමේ බද්ද වෙනුවට නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බද්ද පනවන ලදී. |
| | - ශ්‍රී ලංකාව තුළ නිපදවනු ලබන ඉක්ෂුපාක, තල්, පොල් හා පදම් කළ අරක්කු, මෙරට සෑදූ විදේශීය ස්ප්‍රීතු සහ ධාන්‍ය මත්පැන් සඳහා වන සුරා බදු වැඩි කරන ලදී. |
| | - රා හෝ වෙනත් කිසියම් ධාන්‍ය වර්ගයකින් සෑදූ මත්පැන් හැර තාල වර්ගයේ ගසකින් හෝ වෙනත් ඕනෑම පැළෑටියකින් ලබා ගන්නා ස්වාභාවික නිෂ්පාදන ආසවනය කිරීමෙන් බැහැර ක්‍රියාවලියක් තුළින් ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරනු ලබන මත්පැන් පරිමාවෙන් සියයට 4 කට වඩා මධ්‍යසාර අඩංගු සම්මත සැර මධ්‍යසාර සඳහා වන සුරා බදු වැඩි කරන ලදී. |
| | - තේ, රබර්, පොල්, වැනිලා, කුළුබඩු වැනි කෘෂිකාර්මික ආහාර ද්‍රව්‍ය සහ ස්වභාවික වැලි සහ ඛනිජ අපනයනයේදී පනවා ඇති සෙස් බදු සංශෝධනය කරන ලදී. |
| | - ගැසට් අංක 1885/46 යටතේ සඳහන් මස්, මුහුදු ආහාර, බටර් සහ මේද, එළවළු, පොල්, රටකජු, පළතුරු, තේ, මධ්‍යසාර ඇතුළු අයිතම රැසක් ආනයනය සඳහා පනවා තිබූ සෙස් බදු සංශෝධනය කරන ලදී. |

| | |
|---|---|
| | - පහත සඳහන් අයිතම නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බද්දෙන් නිදහස් කරන ලදී. |
| | - ශ්‍රී ලංකා රජය විසින් විදේශීය සංවිධාන හා විදේශීය රාජ්‍යයන් සමඟ එළඹී ඇති නොයෙකුත් ගිවිසුම් හා අවබෝධතා ගිවිසුම් යටතේ ආනයනය කරනු ලබන මෝටර් රථ/අමතර කොටස් |
| | - කර්මාන්ත විෂය භාර ඇමතිවරයා විසින් නිර්දේශිත එකතු කළ අගය සියයට 30 කට නොඅඩු දේශීයව එකළස් කළ හෝ මෙරට නිෂ්පාදනය කරනු ලබන සංයෝජිත වර්ගීකරණ සංකේත අංක 84 හා 85 කාණ්ඩයට අයත් වන භාණ්ඩ |
| | - ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අනුමැතිය මත ඒකාබද්ධ අරමුදලේ අරමුදල් උපයෝගී කර ගනිමින් රජයේ ආයතන විසින් මූල්‍ය කල්බදු හෝ සෘජු මිලදී ගැනීම් මගින් ආනයනය කරනු ලබන හෝ දේශීයව නිෂ්පාදනය කරනු ලබන මෝටර් රථ |
| 2014 නොවැම්බර් 03 | - රත්රන් ආනයනය සඳහා සියයට 4.0 ක තීරු බදු අත්හැරීමක් ලබා දෙන ලදී. ඒ අනුව රත්රන් ආනයනය සඳහා අදාළ වන තීරු බද්ද සියයට 3.5 කි. |
| 2014 නොවැම්බර් 08 | - කිරිපිටි ආනයනය සඳහා ලබා දී තිබූ තීරු බදු අත්හැරීම කිලෝග්‍රෑමයට රුපියල් 100 සිට කිලෝග්‍රෑමයට රුපියල් 90 දක්වා අඩු කරන ලදී. ඒ අනුව, කිරිපිටි ආනයනය සඳහා වන තීරු බද්ද කිලෝග්‍රෑමයට රුපියල් 135 කි. |
| | - පෙට්‍රල් ආනයනය සඳහා වන තීරු බදු අත්හැරීම ලීටරයකට රුපියල් 23 සිට ලීටරයකට රුපියල් 20 දක්වා අඩු කරන ලදී. ඒ අනුව, පෙට්‍රල් ආනයනය සඳහා වන තීරු බද්ද ලීටරයකට රුපියල් 15 කි. |
| | - ඩීසල් ආනයනය සඳහා වන තීරු බදු අත්හැරීම ලීටරයකට රුපියල් 13 සිට ලීටරයකට රුපියල් 11 දක්වා අඩු කරන ලදී. ඒ අනුව, ඩීසල් ආනයනය සඳහා වන තීරු බද්ද ලීටරයකට රුපියල් 4 කි. |
| 2014 දෙසැම්බර් 02 | - අර්තාපල් ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හතරක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 40 සිට කිලෝග්‍රෑමයට රුපියල් 20 දක්වා අඩු කරන ලදී. |
| | - බොම්බයි ළූණු ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හතරක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 35 සිට කිලෝග්‍රෑමයට රුපියල් 50 දක්වා වැඩි කරන ලදී. |
| | - මුං ඇට ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හතරක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 70 සිට කිලෝග්‍රෑමයට රුපියල් 40 දක්වා අඩු කරන ලදී. |
| | - සීනි ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හතරක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 33 සිට කිලෝග්‍රෑමයට රුපියල් 28 දක්වා අඩු කරන ලදී. |
| | - අළුත් හෝ ශීත කළ මසුන්, උම්බලකඩ, වියළි හාල්මැස්සන්, කරවල, යෝගට්, බටර්, කිරි ආහාර, රතු ළූණු, සුදු ළූණු, අළුත් දොඩම්, මිදි, ඇපල්, මිරිස්, කොත්තමල්ලි ඇට, සුදුරු බීජ, මහදුරු බීජ, කහ, උළුහාල් ඇට, සහල්, කුරක්කන් පිටි, උඳු පිටි, රට කජු, අබ ඇට, එළවළු තෙල්, මාගරින්, ටින් මාළු සහ ලූණු ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හතරක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී. |
| 2014 දෙසැම්බර් 05 | - පෙට්‍රල් ආනයනය සඳහා ලබා දී තිබූ ලීටරයකට රුපියල් 20 ක තීරු බදු අත්හැරීම ඉවත් කරන ලදී. ඒ අනුව, පෙට්‍රල් ආනයනය සඳහා වන තීරු බද්ද ලීටරයකට රුපියල් 35 කි. |
| | - ඩීසල් ආනයනය සඳහා වන තීරු බදු අත්හැරීම ලීටරයකට රුපියල් 11 සිට ලීටරයකට රුපියල් 6 දක්වා අඩු කරන ලදී. ඒ අනුව, ඩීසල් ආනයනය සඳහා වන තීරු බද්ද ලීටරයකට රුපියල් 9 කි. |
| 2014 දෙසැම්බර් 13 | - අර්තාපල් ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස තුනක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 20 සිට කිලෝග්‍රෑමයට රුපියල් 10 දක්වා අඩු කරන ලදී. |

| | |
|---|---|
| 2015 ජනවාරි 01 | - බොම්බයි ළූණු ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හතරක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 50 සිට කිලෝග්‍රෑමයට රුපියල් 10 දක්වා අඩු කරන ලදී. |
| 2015 ජනවාරි 22 | - සහල් ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හතරක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 1 සිට කිලෝග්‍රෑමයට රුපියල් 20 දක්වා වැඩි කරන ලදී. |
| 2015 ජනවාරි 30 | - සිලින්ඩර ධාරිතාව ඝන සෙන්ටිමීටර 1,000 ට අඩු මෝටර් වාහන සඳහා වන නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බද්ද අඩු කරන ලද අතර, දෙමුහුන් මෝටර් වාහන සඳහා වන නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බද්ද වැඩි කරන ලදී. |
| | - පෝට්ලන්ඩ් සිමෙන්ති සහ යකඩ හෝ මිශ්‍ර ලෝහ නොවන වානේවලින් කළ අර්ධ නිමි භාණ්ඩ තීරු බද්දෙන් නිදහස් කරන ලදී. |
| | - පහත සඳහන් ආහාර ද්‍රව්‍ය ආනයනය සඳහා විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද ඉදිරි මාස හයක කාලයකට අදාළ වන පරිදි අඩු කරන ලදී.<br>- උම්බලකඩ කිලෝග්‍රෑමයට රුපියල් 302 සිට කිලෝග්‍රෑමයට රුපියල් 102 දක්වා<br>- වියළි හාල්මැස්සන් කිලෝග්‍රෑමයට රුපියල් 26 සිට කිලෝග්‍රෑමයට රුපියල් 11 දක්වා<br>- මුං ඇට කිලෝග්‍රෑමයට රුපියල් 40 සිට කිලෝග්‍රෑමයට රුපියල් 10 දක්වා<br>- උඳු කිලෝග්‍රෑමයට රුපියල් 110 සිට කිලෝග්‍රෑමයට රුපියල් 60 දක්වා<br>- මිරිස් (අඹරන ලද හෝ කුඩු කළ) කිලෝග්‍රෑමයට රුපියල් 150 සිට කිලෝග්‍රෑමයට රුපියල් 125 දක්වා<br>- කොත්තමල්ලි ඇට කිලෝග්‍රෑමයට රුපියල් 46 සිට කිලෝග්‍රෑමයට රුපියල් 26 දක්වා<br>- කොත්තමල්ලි (අඹරන ලද හෝ කුඩු කළ) කිලෝග්‍රෑමයට රුපියල් 202 සිට කිලෝග්‍රෑමයට රුපියල් 52 දක්වා<br>- කහ (නොඅඹරන ලද හෝ කුඩු නොකළ) කිලෝග්‍රෑමයට රුපියල් 202 සිට කිලෝග්‍රෑමයට රුපියල් 102 දක්වා<br>- කහ (වෙනත්) කිලෝග්‍රෑමයට රුපියල් 510 සිට කිලෝග්‍රෑමයට රුපියල් 360 දක්වා<br>- උඳු පිටි කිලෝග්‍රෑමයට රුපියල් 300 සිට කිලෝග්‍රෑමයට රුපියල් 200 දක්වා<br>- ටින් මාළු කිලෝග්‍රෑමයට රුපියල් 102 සිට කිලෝග්‍රෑමයට රුපියල් 50 දක්වා<br>- සීනි කිලෝග්‍රෑමයට රුපියල් 28 සිට කිලෝග්‍රෑමයට රුපියල් 18 දක්වා |

**විදේශ විනිමය කළමනාකරණය**

| | |
|---|---|
| 2014 මාර්තු 17 | - 2010, 2011 සහ 2012 වසරවල දී ශ්‍රී ලංකා රජය විසින් ශ්‍රී ලංකාවෙන් පිටත නිකුත් කරන ලද ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර, ද්වීතියික වෙළඳපොළෙන් අත්පත් කර ගැනීමට, ඇරීමට හා පැවරීමට බලපත්‍රලාභී වාණිජ බැංකුවලට අනුමැතිය ලබා දෙන ලදී. |
| 2014 මැයි 28 | - විදේශ ගමන් සඳහා විදේශ විනිමය ලබා ගැනීමට සුදුසුකම් ලත් පුද්ගලයන්හට සංචාරක කාඩ්පත් නිකුත් කිරීමට බලයලත් වෙළෙඳුන්හට අවසර ලබා දෙන ලදී. |
| | - විශේෂ විදේශ ආයෝජන තැන්පතු ගිණුම් (SFIDA) සඳහා පැවති අවම තැන්පතු සීමාව ඉවත් කරන ලදී. |
| | - විදේශ විනිමය උපයන්නන්ගේ ගිණුම් පවත්වා ගෙන යනු ලබන පුද්ගලයන්ට, එම ගිණුම්වල පවතින මුදල්වලින් විදේශ කොන්ත්‍රාත් හා බැඳුනු ගෙවීම් කිරීමට අවසර ලබා දෙන ලදී. |
| | - භාණ්ඩ ආනයනකරුවෙකුහට භාණ්ඩ සැපයුම්කරු විසින් පිරිනමන ලද ණය පහසුකම් සඳහා පොලී ගෙවීම වෙනුවෙන් ප්‍රතිමුඛ ප්‍රේෂණයන් සිදු කිරීමට බලයලත් වෙළෙඳුන්හට අවසර ලබා දෙන ලදී. |
| | - විනිමය පාලකවරයාට යොමු කිරීමෙන් තොරව ණයවර ලිපි නිකුත් කිරීමට, වලංගු කාලසීමාව දීර්ඝ කිරීමට සහ වගන්ති සංශෝධනය කිරීමට බලයලත් වෙළෙඳුන්හට අවසර ලබා දෙන ලදී. |

- සුරැකුම්පත් ආයෝජන ගිණුම (SIA) හරහා ලැයිස්තුගත නොකළ ණයකරවල ආයෝජනය කිරීමට විදේශීය ආයෝජකයන් හට අවසර ලබා දෙන ලදී.
- සංක්‍රමණික ආවෘත ගිණුම් හිමියන්, සුරැකුම්පත් ආයෝජන ගිණුම් හිමියන් සහ රාජ්‍ය දූත ගිණුම් හිමියන් වැනි බොහෝ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හිමියන්ට ඉලෙක්ට්‍රොනික මුදල් හුවමාරු කාඩ්පත් (EFTCs) ලබා ගැනීම සඳහා අවසර ලබා දෙන ලදී.
- ශ්‍රී ලංකාවේ නේවාසික සිසුන් ශිෂ්‍ය වීසා බලපත්‍ර ලබා ගැනීම සඳහා අයදුම් කිරීමේ දී විදේශීය රාජ්‍යයන් විසින් පනවා ඇති අවශ්‍යතාවන් ආවරණය කිරීම සඳහා ප්‍රතිමුඛ ප්‍රේෂණ සිදු කිරීමට බලයලත් වෙළෙඳුන් හට අවසර ලබා දෙන ලදී.
- අධ්‍යාපන කටයුතු සඳහා ශ්‍රී ලංකාවෙන් බැහැරව වෙනත් රටකට යෑමට බලාපොරොත්තු වන ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයෙකුට ශ්‍රී ලංකාවෙන් පිටත බැංකුවක ගිණුම් විවෘත කිරීම, පවත්වා ගෙන යෑම හා ක්‍රියාත්මක කිරීම සඳහා අවසර ප්‍රදානය කරන ලදී.

2014 සැප්තැම්බර් 29
- අතීතයට සහ අනාගතයට සාධාරණ කාලපරිච්ඡේදයක් සඳහා ඇගයීමට ලක් කරන ලද විදේශ විනිමය මුදල් ප්‍රවාහයන් ඇසුරින් ණය ආපසු ගෙවීමේ හැකියාව තක්සේරු කිරීමෙන් අනතුරුව විදේශ විනිමය උපයන්නන්ගේ ගිණුම් හිමි පුද්ගලයන්හට ඕනෑම අරමුණක් වෙනුවෙන් විදේශ ව්‍යවහාර මුදලින් ණය ලබා දීමට බලයලත් වෙළෙඳුන් හට අවසර ලබා දෙන ලදී.

2014 ඔක්තෝබර් 27
- විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් විවෘත කිරීමේ දී හා පවත්වා ගෙන යෑමේ දී චීන රෙන්මින්බි යොදා ගත හැකි බව බලයලත් වෙළෙඳුන් වෙත දැනුම් දෙන ලදී.

2014 දෙසැම්බර් 31
- එතෙර සංචාරය කරන ශ්‍රී ලංකාවේ වාසය කරන පුද්ගලයන් සඳහා ගමන් දීමනාවේ කොටසක් ලෙස, එ.ජ. ඩොලර් 10,000 හෝ ඊට සමාන වන ප්‍රමාණයක් දක්වා වෙනත් ඕනෑම පරිවර්ත්‍ය විදේශ ව්‍යවහාර මුදලකින් විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු නිකුත් කිරීමට බලය ලත් වෙළෙඳුන් වෙත අවසර ප්‍රදානය කරන ලදී.
- නේවාසික නැව් බඩු ප්‍රවාහන සේවාවන්හි නිරත ශ්‍රී ලංකාවේ සිටින හෝ වාසය කරන පුද්ගලයන් සඳහා පනවා තිබූ කොන්දේසි හා අවශ්‍යතාවයන් ඉවත් කරන ලදී.

## රාජ්‍ය මූල්‍ය අංශය

**රාජ්‍ය ආදායම**

2014 ජනවාරි 01
- විදුලි සංදේශ කර්මාන්තයේ උසස් තාක්ෂණික උපකරණ සඳහා භාවිතා කරන තඹ කම්බි ආනයනය හෝ දේශීයව මිලදී ගැනීම එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කරන ලදී.
- පළාත් පාලන ආයතන විසින් අපද්‍රව්‍ය බැහැර කිරීම් කටයුතු සඳහා භාවිතා කරනු ලබන ගලි බවුසර්, මාර්ග ට්‍රැක්ටර් සඳහා යොදා ගන්නා අර්ධ ට්‍රේලර්ස්, යන්ත්‍ර සහ උපකරණ ආනයනයේ දී ලබාදුන් එකතු කළ අගය මත බදු නිදහස දේශීය නිෂ්පාදකයින්ගෙන් මිල දී ගත් විට ද ලබා දෙන ලදී.
- ටයි පටි සහ බෝ ටයි පටි, උසස් තත්ත්වයෙන් යුත් පෑන්, ශීත කළ මාළු ඇම, බිලී පිති/ බිලී කොකු/ මාළු බාන යොත්, මාළු බාන රෝද සහ නාවික ධාවන එන්ජින් ආනයනය හෝ සැපයීම එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කරන ලදී.
- පහත සඳහන් භාණ්ඩ ආනයනය හෝ සැපයුම් මත ලබාදුන් එකතු කළ අගය මත බදු නිදහස ඉවත් කර සියයට 12 ක බද්දට යටත් කරන ලදී.
  - වී, සහල්, තිරිඟු, කරදමුංගු, කුරුඳු, කරාබුනැටි, සාදික්කා, වසාවාසි, ගම්මිරිස්, කපාපු පොල්, රබර්, රබර් කිරි, පොල් ගෙඩි, අමු තේ දළු ඇතුළුව තේ, හාල්පිටි, තිරිඟු පිටි, පාන්, බිත්තර, දියර කිරි හෝ කිරිපිටි
  - කෘෂිකාර්මික ට්‍රැක්ටර්, හෝ අර්ධ ට්‍රේලර් සඳහා වූ මාර්ග ට්‍රැක්ටර්
  - තේ හා රබර් කර්මාන්ත සඳහා යොදාගනු ලබන යන්ත්‍ර සහ උපකරණ
  - කර්මාන්තශාලා නවීකරණය කිරීම සඳහා යොදාගනු ලබන යන්ත්‍ර
  - බඳු විරාම ලැබීමට සුදුසුකම් ලැබූ ව්‍යවසායයන් සඳහා වූ පිරියත හා යන්ත්‍ර උපකරණ
  - ඖෂධ සැකසුම්

- තොග සහ සිල්ලර වෙළෙඳාමට එකතු කළ අගය මත බදු අය කිරීම සඳහා පැවතිය යුතු කාර්තුවක් සඳහා විකුණුම් වටිනාකම රුපියල් මිලියන 500 සිට රුපියල් මිලියන 250 දක්වා අඩුකරන ලදී.
- එකතු කළ අගය මත බද්දට යටත් වන සැපයුම් හා බදු නිදහස් සැපයුම්, තොග හා සිල්ලර වෙළෙඳාම සම්බන්ධයෙන් ඇති විට බදු නිදහස අදාළ වන භාණ්ඩ සැපයුම, මුළු සැපයුමෙන් සියයට 25 කට සීමා කරන ලදී.
- ශ්‍රී ලංකාවේ පිහිටා ඇති ජාත්‍යන්තර ආයතනයකට අයත් ප්‍රධාන කාර්යාලයක් හෝ ප්‍රාදේශීය කාර්යාලයක් වෙත ලැබෙන විදේශීය ව්‍යවහාර මුදල්, එකතු කළ අගය මත බද්දෙන් සහ ජාතිය ගොඩනැගීමේ බද්දෙන් නිදහස් කරන ලදී.
- එකතු කළ අගය මත බදු සම්බන්ධයෙන් වන "ජාත්‍යන්තර ගමනාගමනය" සඳහා වන අර්ථ නිරූපනය ශ්‍රී ලංකාව තුළ පිහිටා ඇති ගුවන් තොටුපළවල් අතර භාණ්ඩ හා මගී ප්‍රවාහනයට ඍජුවම අදාළ වන සේවාවන් ආවරණය වන පරිදි දීර්ඝ කරන ලදී.
- පහත සඳහන් අයිතමයන් ජාතිය ගොඩනැගීමේ බද්දෙන් නිදහස් කරන ලදී.
  - තීරු බදු රහිත වෙළඳසල්වල කරනු ලබන සිල්ලර වෙළඳාම
  - දේශීයව නිෂ්පාදනය කරන ලද පොල්තෙල් නිෂ්පාදකයා විසින්ම විකිණීම (වර්ෂ තුනක කාලයක් සඳහා)
  - එල් පී ගෑස් බෙදාහැරීම
  - විදේශ ව්‍යවහාර මුදලින් ගෙවීම සිදු කරන ඕනෑම ගුවන් තොටුපළකින් සපයනු ලබන සේවාවන්
- විශේෂ වෙළඳ භාණ්ඩ බද්දට යටත් භාණ්ඩ සඳහා වන ජාතිය ගොඩනැගීමේ බදු නිදහස රේගුවේ දී ගෙවිය යුතු බද්දට සීමා කරන ලදී. ඒ අනුව, එවැනි භාණ්ඩවල දේශීය සැපයුම ජාතිය ගොඩනැගීමේ බද්දට යටත් වේ.
- ආයෝජන අරමුදල් ගිණුමෙහි අරමුදල් තැන්පත් කිරීමෙහි අවශ්‍යතාවය ඉවත් කිරීමත් සමග මූල්‍ය සේවා සඳහා ජාතිය ගොඩනැගීමේ බද්ද නැවත අදාළ කරන ලදී.
- ට්‍රැක්ටර් විකිණීමෙන් ලැබෙන පිරිවැටුම ජාතිය ගොඩනැගීමේ බද්දෙන් නිදහස් කිරීම දේශීය වශයෙන් නිෂ්පාදනය කරන ලද ට්‍රැක්ටර් සඳහා පමණක් ලබාදෙන ලදී.
- ඖෂධ සැකසුම් ආනයනය ජාතිය ගොඩනැගීමේ බද්දට යටත් කරන ලදී.
- විදුලි සංදේශ බද්ද සියයට 20 සිට සියයට 25 දක්වා ඉහළ නංවන ලදී. කෙසේ වෙතත්, තොරතුරු තාක්ෂණය හා ව්‍යාපාර ක්‍රියාවලි බාහිර පාර්ශ්වයන්ට පැවරීමේ අංශයන් දිරිමත් කිරීම සඳහා අන්තර්ජාල සේවාවන්/බ්‍රෝඩ් බෑන්ඩ් සේවාවන් හරහා සිදු කරනු ලබන සේවාවන් සඳහා වූ සියයට 10 ක සහනදායී බදු අනුපාතය නොවෙනස්ව පවතී.
- දේශීය අගය එකතු කිරීම සඳහා තොරතුරු තාක්ෂණය ආශ්‍රිත මුද්‍රණ යන්ත්‍ර, දෘෂ්‍ය ෆයිබර් රැහැන්, සූර්ය ආරක්ෂක පටල, වෙළඳපොළ සංවර්ධනය සඳහා පිළිගත් වෙළඳ නාම සහිත භාණ්ඩ, යන්ත්‍ර සූත්‍ර හා බැර කර්මාන්ත, ආයුර්වේද නිෂ්පාදන ආශ්‍රිත කර්මාන්තය, ධීවර කර්මාන්තය, රසකැවිලි නිෂ්පාදන කර්මාන්තය, රත්රන් සහ මෝටර් රථ ආනයනය සහ අනෙකුත් දේශීය නිෂ්පාදන ආනයනය මත වන රේගු බදු සංශෝධනය කරන ලදී.

2014 ජනවාරි 21

- ඝනකම මිලි මීටර 0.30 නොඉක්මවන්නා වූ ඖෂධ ඇසුරුම් පටල ආනයනය කිරීම සෙස් බද්දෙන් නිදහස් කරන ලදී.
- සනීපාරක්ෂක තුවා සහ ටැම්පෝන ආනයනය සඳහා සියයට තිහක හෝ කිලෝග්‍රෑමයට රුපියල් 350 ක සෙස් බද්දක් පනවන ලදී.
- තෙත් පිරිසිදු කිරීමේ කඩදාසි ආනයනය සඳහා අය කළ සෙස් බද්ද සියයට 30 හෝ කිලෝග්‍රෑමයට රුපියල් 350 දක්වා වැඩි කරන ලදී.

2014 අප්‍රේල් 01

- පහත සඳහන් ආයතනයන්හි ලාභ සහ ආදායම් (ලාභාංශ සහ පොලී ආදායම් හැර) ආදායම් බද්දෙන් නිදහස් කරන ලදී.
  - 2006 අංක 17 දරන ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරි පනත යටතේ පිහිටුවන ලද ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය

- 1980 අංක 41 දරන ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතන පනත යටතේ සංස්ථාගත කරන ලද ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනය
- 1986 අංක 12 දරන ශ්‍රී ලංකා භෞතික විද්‍යා ආයතන පනත යටතේ සංස්ථාගත කරන ලද ශ්‍රී ලංකා භෞතික විද්‍යා ආයතනය
- භාර ආඥා පනතේ 114 වගන්තිය යටතේ පිහිට වූ ලයනල් වෙන්ඩට් අනුස්මරණ අරමුදල

- පහත සඳහන් අංශවලින් උපයන ලද ලාභ සහ ආදායම් සඳහා සහනදායී ආදායම් බදු අනුපාතයන් ලබාදෙන ලදී.
  - ඇඟලුම් අපනයනකරුවන්ට සපයනු ලබන විවිධ සේවාවන්ගෙන් ලැබෙන ලාභ හා ආදායම් මත දැනට අදාළ වන සහනදායී බදු අනුපාතය වූ සියයට 12, භාණ්ඩ හා සේවා අපනයනකරුවන්ට, හෝ සෘජුවම විදේශීය ප්‍රධානියාට සේවා සැපයීම තුළින් ලැබෙන ලාභ සඳහා ද ලබාදෙන ලදී.
  - වෘත්තීමය සේවා ආදායම රුපියල් මිලියන 35 ඉක්මවන විට, වෘත්තිකයන් සඳහා අදාළ වන උපරිම ආදායම් බදු අනුපාතය සියයට 16 දක්වා අඩු කරන ලදී.
  - බැංකු ණය පහසුකම් මත වෘත්තිකයන් විසින් නිවාස සංකීර්ණ ඉදිකිරීමේ දී, ඒ සඳහා අදාළ වන පොළිය මත ගෙවිය යුතු බද්ද අදාළ බදු අනුපාතයෙන් අඩකට සීමා කරන ලදී.
  - ජාත්‍යන්තර සේවාවන් සැපයීම සඳහා වෘත්තිකයන් විසින් පිහිටුවනු ලබන සංස්ථාපිත ආයතන විසින් ගෙවිය යුතු බද්ද අවුරුදු පහක කාලයක් සඳහා අදාළ සංස්ථාපිත බදු අනුපාතයෙන් අඩකට සීමා කරන ලදී.
  - පුහුණුලාභීන්ගේ කුසලතා සංවර්ධනය සඳහා සේවා සපයන නැව් මෙහෙයවන්නන් හෝ කිසියම් විදේශ නාවික ඒජන්තවරයෙකු විසින් ගෙවිය යුතු වන ආදායම් බද්දෙන් සියයට 10 ක් අඩු කරනු ඇත.
- සුදුසුකම් ලැබූ අපනයන සඳහා පැවති සියයට 10ක බදු අනුපාතය සියයට 12ක් ලෙස සංශෝධනය කරන ලදී.
- රුපියල් මිලියන 500 නොඉක්මවන පිරිවැටුමක් ඇති ව්‍යවසායන් සඳහා පැවති සියයට 10 ක බදු අනුපාතය සියයට 12 ක් ලෙස සංශෝධනය කරන ලදී.
- බදු විරාම හා සුදුසුකම් ලබන දීමනා සඳහා අදාල වන සීමා කිරීම් පහත පරිදි වේ.
  - දේශීය ආදායම් පනතේ පර්යේෂණ හා සංවර්ධන කටයුතුවල නියුක්ත යම් සමාගමක බදු නිදහස් කිරීම 2014 අප්‍රේල් 01 දිනට පෙර කරනු ලැබුවා වූ ආයෝජනවලට සීමාකෙරේ.
  - දැනට පවත්නා ව්‍යවසායයන් සඳහා ව්‍යාපාර පුළුල් කිරීම යටතේ කර ඇති ආයෝජන වෙනුවෙන් සුදුසුකම් ලබන දීමනා අඩු කිරීම් 2014 අප්‍රේල් 01 දිනට පෙර කරන ලද ආයෝජනයන් සඳහා සීමාකෙරේ.
  - "විධායක නිලධාරියා" යන්න අර්ථ නිරූපණය සඳහා මාසික මුළු පාරිශ්‍රමිකය රුපියල් 20,000 සිට රුපියල් 75,000 දක්වා සංශෝධනය කරන ලදී.
- ආදායම් බදු සම්බන්ධයෙන් අදාළ වන අඩු කිරීම් හා සුදුසුකම් ලබන දීමනා පහත පරිදි වේ.
  - ජාත්‍යන්තර ආයතනවල ප්‍රධාන කාර්යාල හෝ ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාල හා සම්බන්ධ විශේෂ වියදම්
  - නිවාස සංකීර්ණ ඉදිකිරීම සඳහා වෘත්තිකයන් විසින් ලබාගත් ණය සඳහා ණය වාරික ආපසු ගෙවීමේ දී මසකට රුපියල් 50,000 ක් නොඉක්මවන සුදුසුකම් ලබන දීමනාවක්
  - ජාත්‍යන්තරව පිළිගත් සන්නම් නාම සහිත බුද්ධිමය දේපල මිලදී ගැනීමේ මුළු පිරිවැය
  - ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දක්වා ඇති ආකාරයට ගණනය කර ඇති මූල්‍ය ආයතන අත්කර ගැනීම හෝ ඒකාබද්ධ කර ගැනීම සඳහා වන පිරිවැය

2014 අප්‍රේල් 24

- සමාගමක් විසුරුවා හැරීම හෝ ඒකාබද්ධ කිරීම, අත්පත්කර ගැනීම හෝ ප්‍රතිව්‍යුහගත කිරීම යනාදී වෙනස් කිරීමකට පෙර බදු නිශ්කාෂණ සහතිකයක් ලබා ගැනීමේ අවශ්‍යතාවය ඇතුලත් වන පරිදි විධිවිධාන නිකුත් කරන ලදී.

| | |
|---|---|
| 2014 මැයි 26 | - යම් සමාගමක යම් කොටස් සංඛ්‍යාවක් නිකුත් කිරීම, මාරු කිරීම හෝ පැවරීම මත නිකුත් කරනු ලබන යම් කොටස් සහතිකයක් සඳහා වන මුද්දර ගාස්තු සංශෝධනය කරන ලදී. |
| 2015 ජනවාරි 01 | - එකතු කළ අගය මත බදු අනුපාතිකය සියයට 12 සිට සියයට 11 දක්වා අඩු කරන ලදී.<br>- ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් නම් කරන ලද වරායයන් තුළ භාවිතා කිරීම සඳහා යන්ත්‍ර සූත්‍ර, උපකරණ සහ අමතර කොටස් ආනයනය කිරීම එකතු කළ අගය මත බද්දෙන් සහ ජාතිය ගොඩනැගීමේ බද්දෙන් නිදහස් කරන ලදී.<br>- එකතු කළ අගය මත බද්දෙන් සහ ජාතිය ගොඩනැගීමේ බද්දෙන් නිදහස් නියැදි වටිනාකම රුපියල් 25,000 සිට රුපියල් 50,000 දක්වා වැඩි කරන ලදී.<br>- තොග සහ සිල්ලර වෙළඳාමට එකතු කළ අගය මත බදු අය කිරීම සඳහා පැවතිය යුතු කාර්තුවක් සඳහා විකුණුම් වටිනාකම රුපියල් මිලියන 250 සිට රුපියල් මිලියන 100 දක්වා අඩු කරන ලදී.<br>- එකතු කළ අගය මත බද්දට ලියාපදිංචි කිරීම සඳහා බද්දට යටත් සැපයුම් සීමාව වර්ෂයකට රුපියල් මිලියන 12 සිට වර්ෂයකට රුපියල් මිලියන 15 දක්වා වැඩි කරන ලදී.<br>- ජාතිය ගොඩනැගීමේ බද්දෙන් නිදහස් පිරිවැටුමේ සීමාව කාර්තුවකට රුපියල් මිලියන 3 සිට කාර්තුවකට රුපියල් මිලියන 3.75 දක්වා වැඩි කරන ලදී.<br>- දළ ආදායම මත සියයට 5 ක් වූ ඔට්ටු හා සූදු බද්ද සියයට 10 දක්වා වැඩි කරන ලදී.<br>- කැසිනෝ විනෝදශාලාවලට ඇතුල් වන සෑම පුද්ගලයකුගෙන්ම එ.ජ. ඩොලර් 100 ක ඇතුල්වීමේ ගාස්තුවක් අය කෙරේ. |
| **අපේක්ෂිත** | - පහත සඳහන් පුද්ගලයන්/ආයතනවල වන ලාභ සහ ආදායම, ආදායම් බද්දෙන් නිදහස් කෙරෙනු ඇත.<br>  - 2015 ජනවාරි 01 දින හෝ ඊට පසු එ.ජ. ඩොලර්වලින් වටිනාකම නියම කෙරෙන තැන්පතු හෝ විදේශීය කොටස් හුවමාරුවල ලැයිස්තුගත කෙරෙන සුරැකුම්වල ආයෝජනය කිරීමෙන් යම් ඒකක භාරයකට ලැබෙන ලාභ සහ ආදායම්<br>  - තොරතුරු තාක්ෂණ/ව්‍යාපාර ක්‍රියාවලි බාහිර පාර්ශ්වයන්ට පැවරීමේ (IT/BPO) සේවා සපයන යම් සමාගමක් එම සමාගම ආරම්භ කර වසර දෙකක කාල සීමාවක් තුළ විශේෂ අවශ්‍යතාවක් අනුව රාජ්‍ය භාග ලෙස කරනු ලබන යම් ගෙවීමකින් ශ්‍රී ලංකාවෙන් පිට යම් සමාගමකට, හවුල් ව්‍යාපාරයකට හෝ පුද්ගල මණ්ඩලයකට ලැබෙන ලාභ සහ ආදායම්<br>  - නාගරික සංවර්ධන අධිකාරිය විසින් නිකුත් කරනු ලබන සාංගමික ණය සුරැකුම්පතක 2013 ජනවාරි 01 දින හෝ ඊට පසුව කරනු ලබන ආයෝජන<br>- පහත දැක්වෙන අයිතම සඳහා සහනදායී ආදායම් බදු අනුපාත හඳුන්වා දෙනු ඇත.<br>  - 1970 දශකයේ දී නිෂ්පාදන ව්‍යාපාර ආරම්භ කරන ලද දේශීය නිෂ්පාදකයන් ගෙවිය යුතු ආදායම් බද්ද සියයට 10 කින් අඩු කරනු ලැබේ.<br>  - සියයට 12 සහනදායී බදු අනුපාතය දේශීය සීනි කර්මාන්තයට අදාළ වනු ඇත.<br>  - සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සියයට 12 ක සහනදායී බදු අනුපාතය සඳහා සුදුසුකම් ලැබීමේ වාර්ෂික පිරිවැටුම් සීමාව රුපියල් මිලියන 500 සිට රුපියල් මිලියන 750 දක්වා ඉහළ නංවනු ලැබේ.<br>  - ජාත්‍යන්තර චිත්‍රපට/නාට්‍ය උළෙලක දී සම්මානලාභී චිත්‍රපටයක් හෝ නාට්‍යයක් නිපදවන පුද්ගලයෙකුගේ චිත්‍රපට/නාට්‍ය නිෂ්පාදනයෙන් ලැබෙන ලාභ සහ ආදායමෙන් අඩක් අදාළ සම්මානය ලැබූ වසරේ සිට වසර පහක් දක්වා බද්දෙන් නිදහස් කරනු ලැබේ.<br>  - සේවානියුක්ති අංශ කිහිපයකට අදාළ වූ සියයට 16 ක උපරිම බදු අනුප්‍රමාණය අනෙකුත් සේවානියුක්ති අංශවලට ද පුළුල් කරනු ලැබේ.<br>  - එ.ජ. ඩොලර් මිලියන 2 කට නොඅඩු ආයෝජනයන් සහිත අපනයන සඳහා භාණ්ඩ නිෂ්පාදනයේ යෙදී සිටින නව ව්‍යවසායයක් සඳහා ස්ථාවර වත්කම් අත්කර ගැනීම මත ක්ෂය දීමනා එකවර අඩු කිරීමට ඉඩ දෙන අතර එවැනි ආයෝජන මගින් උපයන ලාභයෙන් බෙදා හරිනු ලබන ලාභාංශ වසර පහක් දක්වා ආදායම් බද්දෙන් නිදහස් වේ. |

- මත්පැන් සහ දුම්කොළ හැර භාණ්ඩ නිෂ්පාදනයේ යෙදී සිටින යම් ව්‍යාපාරයක් බස්නාහිර පළාත හැර වෙනත් පළාතකට ව්‍යාප්ත කරන්නේ නම් කොන්දේසි කිහිපයක් යටතේ වසර පහක කාලසීමාවක් සඳහා එම ව්‍යාපාරයේ ලාභ සහ ආදායම් මත බදු අනුප්‍රමාණය සියයට 50 කින් රුපියල් මිලියන 500 ක් නොඉක්මවන ප්‍රමාණයක් දක්වා අඩු කරනු ලැබේ.
- දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් අනුමත කරන ලද කාලපරිච්ඡේදයක් තුළ මත්පැන් හෝ දුම්කොළ හැර යම් නිෂ්පාදන ව්‍යාපාරයක රුපියල් මිලියන 500 ක් ඉක්මවන එකඟ වූ ආයෝජනයක් සහිතව 2015 දෙසැම්බර් 31 දින හෝ ඊට පෙර බදු ගෙවීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වන යම් සමාගමක් වසර 7 ක් දක්වා අදාළ බදු අනුප්‍රමාණයෙන් සියයට 50 ක අඩු කිරීමක් සඳහා හිමිකම් ලබයි.

- පොලී ප්‍රමාණය නොසලකා සියයට 2.5 ක තනි රඳවා ගැනීමේ බදු ප්‍රතිශතයක් හඳුන්වා දෙනු ලැබේ.
- ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා පොලී ආදායම රඳවා ගැනීමේ බද්දෙන් නිදහස් කෙරේ.
- තෘතීයික වෘත්තීය අධ්‍යාපන කොමිසම යටතේ ලියාපදිංචි වී ඇති යම් තැනැත්තෙකු විසින් පුහුණුවන්නන් සඳහා පිළිගත් හැකියා ප්‍රවර්ධන පුහුණුව ලබාදීම සඳහා දරනු ලැබූ වියදම මෙන් තුන් ගුණයක් බදු අය කළ හැකි ආදායමෙන් අඩු කිරීමට ඉඩ ලබා දෙනු ලැබේ.
- වෘත්තිකයකුගේ ආදායම මත වන උපයන විට ගෙවීමේ බදු සඳහා නිදහස් සීමාව රුපියල් 600,000 සිට රුපියල් 750,000 දක්වා ඉහළ නංවනු ඇත.
- සියළුම කැසිනෝ ව්‍යාපාරිකයන්ගෙන් එක්වරක් පමණක් ගෙවිය යුතු රුපියල් මිලියන 1,000 ක විශේෂ බද්දක් අය කෙරෙනු ඇත.
- ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු පනත යටතේ ගෙවිය යුතු වාර්ෂික අය බද්ද දෙගුණ කෙරෙනු ඇත.
- තැබෑරුම් සහ මත්පැන් අලෙවි සැල් සඳහා එක් වරක් පමණක් ගෙවිය යුතු රුපියල් 250,000 ක විශේෂ බද්දක් පනවනු ඇත.
- බලපත්‍රලාභී ජංගම දුරකථන ක්‍රියාකරුවන් වෙත එක් වරක් පමණක් ගෙවිය යුතු රුපියල් මිලියන 250 ක අය බද්දක් පනවනු ඇත.
- ශ්‍රී ලංකාවට වෙන් කර ඇති චන්ද්‍රිකා පවත්වා ගත හැකි මධ්‍යස්ථාන භාවිතා කරන චන්ද්‍රිකා අයිතිකරුවන් වෙත එක් වරක් පමණක් ගෙවිය යුතු රුපියල් මිලියන 1,000 ක විශේෂ අය බද්දක් පනවනු ඇත.
- සන්නිවේදන ස්ථාන 5 කට වඩා ඇති දීප ව්‍යාප්තව ක්‍රියාත්මක වන ක්‍රීඩා සඳහා පමණක් වූ නාලිකාවලට රුපියල් මිලියන 1,000 ක අය බද්දක් පනවනු ඇත.
- රීලෝඩ් සඳහා පාරිභෝගිකයන් විසින් රජයට ගෙවිය යුතු සියයට 25 ක බද්ද ජංගම දුරකථන පහසුකම් සපයන්නන් විසින් දැරිය යුතු වනු ඇත.
- රුපියල් මිලියන 150 හෝ ඊට වැඩියෙන් තක්සේරුවට ලක් කර ඇති හෝ වර්ග අඩි 10,000 ට වැඩි නිවාස මත රුපියල් මිලියන 1 ක මන්දිර බද්දක් පනවනු ඇත.
- විදේශ රටවලට සංක්‍රමණය වන ශ්‍රී ලාංකිකයන් විසින් සංක්‍රමණය වන අවස්ථාවේ දී රටින් පිටතට ගෙන යන විදේශ විනිමය සඳහා සියයට 20 ක බද්දක් අය කරනු ඇත.
- 2013/14 බදු වර්ෂය තුළ රුපියල් මිලියන 2,000 කට අධික ලාභයක් උපයන ලද ඕනෑම පුද්ගලයකුගේ හෝ සමාගමක ලාභය මත සියයට 25 ක එක් වරක් පමණක් ගෙවිය යුතු සුපිරි බද්දක් පනවනු ඇත.

**රාජ්‍ය වියදම**

2014 ජනවාරි 01

- සියලුම රජයේ සේවකයන් සඳහා වන ජීවන වියදම් දීමනාව මසකට රුපියල් 7,800 ක් දක්වා රුපියල් 1,200 කින් වැඩි කරන ලදී.
- 2006 ට පෙර විශ්‍රාම ලැබූවන් සඳහා ජීවන වියදම් දීමනාව මසකට රුපියල් 3,675 දක්වා රුපියල් 500 කින් සහ 2006 න් පසු විශාම ලැබූවන් සඳහා මසකට රුපියල් 3,525 දක්වා රුපියල් 350 කින් ද වැඩි කරන ලදී.

2014 නොවැම්බර් 01 - රජයේ සේවකයන් සහ විශ්‍රාමිකයන් සඳහා පිළිවෙළින් මසකට රුපියල් 3,000 ක සහ රුපියල් 2,500 ක අතුරු දීමනාවක් ලබා දෙන ලදී.

2015 ජනවාරි 01 - රජයේ සේවකයන් සඳහා වන ජීවන වියදම් දීමනාව මසකට රුපියල් 10,000 දක්වා රුපියල් 2,200 කින් වැඩි කරන ලදී.

2015 පෙබරවාරි 01 - රජයේ සේවකයන්ගේ වැටුප් මසකට රුපියල් 7,000 කින් වැඩි කරන ලදී. ඉන් රුපියල් 5,000 ක් පෙබරවාරි මාසයේ සිට ලබා දුන් අතර, ඉතිරිය ජුනි මාසයේ සිට ලබා දෙනු ඇත.

## මුදල් අංශය

2014 ජනවාරි 02 - පොලී අනුපාතික කොරිඩෝව (Policy Rate Corridor) වෙනුවට නිත්‍ය පොලී අනුපාතික කොරිඩෝව (Standing Rate Corridor) පිහිටුවන ලදී.

- නිත්‍ය ප්‍රතිමිලදීගැනුම් පහසුකම (Standing Repurchase Facility), නිත්‍ය තැන්පතු පහසුකම (Standing Deposit Facility) ලෙස නැවත නම් කරන ලද අතර බැංකු පද්ධතියෙහි අතිරික්ත අරමුදල් දෛනික පදනම මත ශ්‍රී ලංකා මහ බැංකුවෙහි තැන්පත් කිරීම සඳහා වන අනුපාතිකය නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (Standing Deposit Facility Rate) වේ.
- නිත්‍ය ප්‍රතිවිකුණුම් පහසුකම (Standing Reverse Repurchase Facility), නිත්‍ය ණය පහසුකම (Standing Lending Facility) ලෙස නැවත නම් කරන ලද අතර, බැංකු පද්ධතියට දෛනික පදනම මත ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අරමුදල් ලබාදීමේ අනුපාතිකය නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (Standing Lending Facility Rate) වේ.
- නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය සියයට 8.00 දක්වා පදනම් අංක 50 කින් අඩු කරන ලද අතර එමගින් නිත්‍ය පොලී අනුපාතික කොරිඩෝව පැවති පදනම් අංක 200 සිට පදනම් අංක 150 දක්වා සංකෝචනය කරන ලදී.

- මෝටර් රථ ආනයනය සඳහා වාණිජ බැංකු සමග ණයවර ලිපි විවෘත කිරීමේ දී පැවති සියයට සියයක අවම ආන්තික මුදල් තැන්පතු අවශ්‍යතාවය ඉවත් කරන ලදී.

2014 පෙබරවාරි 01 - ශ්‍රී ලංකා මහ බැංකුවේ රුපියල් ගනුදෙනු සඳහා ශුන්‍ය ණය අවදානමක් පවතින බැවින් විවට වෙළඳපොළ කටයුතු සඳහා සහභාගිවන්නන්ට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිත්‍ය තැන්පතු පහසුකම් යටතේ සුරැකුම් ලබාදීමේ අවශ්‍යතාවය අත්හිටුවන ලදී.

2014 සැප්තැම්බර් 23 - වසරකට සියයට 6.50 ක් වන නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය යටතේ විවට වෙළඳපොළ කටයුතු සඳහා සහභාගිවන්නකුට නිත්‍ය තැන්පතු පහසුකම සඳහා ලිත් මාසයක දී ප්‍රවේශ විය හැකි උපරිම වාර ගණන තුනකට සීමා කළ අතර, වාර තුනකට වඩා විවට වෙළඳපොළ කටයුතු සඳහා සහභාගිවන්නකුගේ තැන්පතු සඳහා වන පොළී අනුපාතිකය වසරකට සියයට 5.00 කි. සැප්තැම්බර් මාසය සඳහා නිත්‍ය තැන්පතු පහසුකම යටතේ මුදල් තැන්පත් කිරීමේ දී සියයට 6.50 ක පොලී අනුපාතයක් ලබාදීම දෙවරකට සීමා කරන ලදී.

2015 මාර්තු 02 - සියයට 5.00 ක් වූ විශේෂ නිත්‍ය තැන්පතු පහසුකම ඉවත් කරන ලදී. නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය හා නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පිළිවෙළින් සියයට 6.50 හි සහ සියයට 8.00 ක් තවදුරටත් එලෙසම පවතී.

## මූල්‍ය අංශය

**ලියාපදිංචි බැංකු**

2014 පෙබරවාරි 17 - ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාතය ගණනය කිරීමේ දී බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් ශ්‍රී ලංකා මහ බැංකුවෙහි පවත්වා ගෙන යනු ලබන නිත්‍ය තැන්පතු පහසුකම් ශේෂය, අදාළ බැංකුවල ද්‍රවශීල වත්කම් ලෙස සැලකිය හැකි බව නිර්ණය කරන ලදී.

2014 පෙබරවාරි 25 - ගනුදෙනුකරුවෙකු වෙනත් බැංකුවක ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රයක් මගින් මුදල් ආපසු ගැනීමක දී කාඩ්පත් නිකුත්කරන්නාට ගනුදෙනුකරුගෙන් අය කළ හැකි උපරිම ගාස්තුව, එක් මුදල් ආපසු ගැනීමක් සඳහා රුපියල් 15 සිට රුපියල් 30 දක්වා ඉහළ නංවන ලදී.

| | |
|---|---|
| | - ගනුදෙනුකරුවෙකු විසින් සිදු කරන ලද මුදල් ආපසු ගැනීමක් සඳහා කාඩ්පත් නිකුත්කරන්නෙකුගෙන් මූල්‍ය අත්පත්කරුවකුට අය කළ හැකි උපරිම අන්තර් හුවමාරු ගාස්තුව එක් ආපසු ගැනීමක් සඳහා රුපියල් 20 සිට රුපියල් 35 දක්වා ඉහළ නංවන ලදී. |
| 2014 මාර්තු 31 | - බාසල් II ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා රාමුව යටතේ මෙහෙයුම් අවදානම් සඳහා ප්‍රමිතිගත ක්‍රමවේදය යටතේ අවදානම් මත බරතැබූ ප්‍රාග්ධන ප්‍රමාණය ගණනය කිරීම පිළිබඳ මාර්ගෝපදේශයන් බලපත්‍රලාභී බැංකු වෙත නිකුත් කරන ලදී. |
| 2014 අප්‍රේල් 24 | - ශ්‍රී ලංකා මහ බැංකුවේ නිත්‍ය තැන්පතු පහසුකම යටතේ ඇති තැන්පතු සඳහා වූ රඳවා ගැනීමේ බදු අඩු කිරීම නවතා දමන ලදී. |
| 2014 ජුනි 05 | - තක්සේරුකරුවන්ට අදාළ යෝග්‍යතා නිර්ණායක ද ඇතුළත් කරමින්, නිශ්චල දේපළ තක්සේරුකරණය පිළිබඳ නියාමන රාමුව බලපත්‍රලාභී බැංකු වෙත නිකුත් කරන ලදී. |
| 2014 ජුනි 17 | - බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු විසින් සිදු කරන රන් භාණ්ඩ උකස් ණය සඳහා ණය ඇප ආවරණ යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කරන ලදී. |
| 2014 ජුනි 26 | - ණය පහසුකම් සම්බන්ධ උපරිම සීමා පිළිබඳ විධානයන් සංශෝධනය කරන ලදී. |
| | - 2015 ජූලි 01 දින සිට ක්‍රියාත්මක විය යුතු තොරතුරු ආරක්ෂණ කළමනාකරණය සඳහා වූ මූලික ආරක්ෂණ ප්‍රමිතිය පිළිබඳ වූ විධානයන් බලපත්‍රලාභී බැංකුවලට නිකුත් කරන ලදී. |
| 2014 ජූලි 01 | - වාණිජ බැංකුවල විදේශ විනිමය සම්බන්ධයෙන් වන ශුද්ධ අනාවරණ තත්ත්වය එ.ජ. ඩොලර් මිලියන 120 සිට එ.ජ. ඩොලර් මිලියන 189 දක්වා වැඩි කරන ලදී. |
| 2014 සැප්තැම්බර් 01 | - විද්‍යුත් අරමුදල් හුවමාරු කිරීම සඳහා වූ පොදු යාන්ත්‍රණයේ මෙහෙයුම් කටයුතුවල සුමට ක්‍රියාකාරිත්වය සහතික කිරීම සඳහා යම් විචක්ෂණශීලී සහ අනිවාර්ය අවශ්‍යතා පදනම් කර ගනිමින් ලංකා ක්ලියර් (පුද්.) සමාගමට සහ සාමාජික ආයතනවලට පොදු විධිවිධාන නිකුත් කරන ලදී. |
| 2014 සැප්තැම්බර් 30 | - බැංකුවල ආතති පරීක්ෂණ රාමුව පිළිබඳ මාර්ගෝපදේශයන් බලපත්‍රලාභී බැංකුවලට නිකුත් කරන ලදී. |
| 2014 ඔක්තෝබර් 01 | - ආයෝජන අරමුදල් ගිණුම් පවත්වාගෙන යාම අත්හිටුවන ලදී. |
| 2014 ඔක්තෝබර් 09 | - රන් භාණ්ඩ උකස් අත්තිකාරම් සඳහා වන ණය ඇප ආවරණ යෝජනා ක්‍රමයට අදාළ වාර්ෂික පොලී අනුපාතිකය සියයට 15 සිට සියයට 12 දක්වා අඩු කරන ලදී. |
| 2014 ඔක්තෝබර් 10 | - මූල්‍ය අංශයේ ඒකාබද්ධ කිරීම් ප්‍රවර්ධනය කිරීමට අදාළ බදු දිරිගැන්වීම් පිළිබඳ මාර්ගෝපදේශයන් නිකුත් කරන ලදී. |
| 2014 ඔක්තෝබර් 16 | - අපනයනකරුවන් වෙත ලබා දුන් ණය පහසුකම් අයකර ගැනීම සම්බන්ධයෙන් නිකුත් කර තිබූ චක්‍රලේඛ ඉවත් කරන ලදී. |
| 2014 නොවැම්බර් 27 | - විදේශ ආමුඛ ප්‍රේෂණ වාර්තා කිරීම සම්බන්ධයෙන් බලපත්‍රලාභී බැංකු වෙත චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. |
| 2014 දෙසැම්බර් 23 | - ශ්‍රී ලංකාව තුළ සංස්ථාපිත සියලු බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු විසින් 2016 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි පිළිවෙළින් රුපියල් බිලියන 10 ක සහ රුපියල් බිලියන 5 ක අවම මූලික ප්‍රාග්ධනයක් පවත්වා ගත යුතු බවට චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. |
| 2014 දෙසැම්බර් 30 | - රන් භාණ්ඩ උකස් අත්තිකාරම් සඳහා වන ණය ඇප ආවරණ යෝජනා ක්‍රමයේ මෙහෙයුම් කාලපරිච්ඡේදය 2015 ජනවාරි 1 සිට 2015 ජුනි 30 දක්වා මාස හයක කාලයක් සඳහා දීර්ඝ කරන ලදී. |
| | - රන් භාණ්ඩ උකස් අත්තිකාරම් සඳහා වන ණය ඇප ආවරණ යෝජනා ක්‍රමය බලපත්‍රලාභී මුදල් සමාගම් සඳහා ද පුළුල් කරන ලදී. |
| 2015 ජනවාරි 01 | - ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය යටතේ එක් ආයතනයක එක් තැන්පතු හිමියකු සඳහා වන තැන්පතු රක්ෂණ ආවරණය රුපියල් 200,000 සිට රුපියල් 300,000 දක්වා ඉහළ නංවන ලදී. |

2015 පෙබරවාරි 01 - 2015 ජනවාරි 31 දින හෝ එයට පෙර අක්‍රීය ණය ලෙස වර්ගීකරණය කර ඇති, රාජ්‍ය බැංකු විසින් ගොවීන් වෙත ප්‍රදානය කළ රුපියල් 100,000 ක උපරිමයක් දක්වා වන වගා ණයවල ප්‍රාග්ධනය සියයට 50 කින් කපාහරින ලෙස දැනුම් දෙන ලදී.

2015 මාර්තු 13 - වයස අවුරුදු 60 ට වැඩි ජ්‍යෙෂ්ඨ පුරවැසියන් විසින්, වසරක කාලසීමාවක් සඳහා ආරම්භ කරනු ලබන රුපියල් මිලියන 1 ක් දක්වා රුපියල් ස්ථාවර තැන්පතු සඳහා 2015 ජනවාරි 16 දින සිට ක්‍රියාත්මක වන පරිදි, වසරකට සියයට 15 ක පොලී අනුපාතයක් සහ 2015 ජනවාරි 16 දිනට පෙර ආරම්භ කරන ලද රුපියල් මිලියන 2.5 දක්වා රුපියල් ස්ථාවර තැන්පතු සඳහා වසරකට සියයට 12 ක පොලී අනුපාතයක් ප්‍රදානය කරන ලදී.

2015 මාර්තු 15 - 2015 ජනවාරි 31 දින හෝ එයට පෙර අක්‍රීය ණය ලෙස වර්ගීකරණය කර ඇති, රාජ්‍ය බැංකු විසින් ප්‍රදානය කළ රුපියල් 200,000 දක්වා උකස් අත්තිකාරම් 2015 ජූනි 30 හෝ එයට පෙර පියවනු ලබන අවස්ථාවන්හි දී එවැනි අත්තිකාරම් සම්බන්ධයෙන් සියයට 12 ඉක්මවා අය කර ඇති ණය පොලිය කපා හරින ලදී.

2015 මාර්තු 31 - 2015 අප්‍රේල් මස 01 දින සිට බාසල් III ද්‍රවශීලතා ප්‍රමිතීන් යටතේ ද්‍රවශීලතා ආවරණ අනුපාතය ක්‍රියාවට නැංවීම පිළිබඳ විධානයන් බලපත්‍රලාභී බැංකු වෙත නිකුත් කරන ලදී.

**අපේක්ෂිත**

- අන්තර්ජාතික රාමුවට අනුකූලව බාසල් III ප්‍රාග්ධන ප්‍රමිතීන් ක්‍රියාවට නැංවීම
- වත්කම් වෙළඳපොළ සහ අනෙකුත් විය හැකි ආර්ථික කම්පන සඳහා බැංකු පද්ධතියෙහි නිරාවරණය වීම් නියාමනය කිරීම සඳහා විචක්ෂණශීලී විධානයන් නිකුත් කිරීම
- අර්බුද කළමනාකරණය සහ නිවාරණ රාමුව තවදුරටත් ශක්තිමත් කිරීම

**අනෙකුත් මූල්‍ය ආයතන**

2014 ජනවාරි 17 - මූල්‍ය අංශයේ යෝජිත ඒකාබද්ධ කිරීමේ වැඩසටහනෙහි ප්‍රධාන සැලසුම් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිවේදනය කරන ලදී.

2014 මාර්තු 31 - බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් කාලීන තැන්පතු, පැවරිය නොහැකි තැන්පතු සහතික සහ ණය සාධන පත්‍ර සඳහා ගෙවිය හැකි උපරිම පොලී අනුපාත සීමාවන් සංශෝධනය කරන ලදී.

2014 ජූනි 30 - බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් කාලීන තැන්පතු, පැවරිය නොහැකි තැන්පතු සහතික සහ ණය සාධන පත්‍රවලට ගෙවනු ලබන උපරිම පොලී අනුපාත නිර්ණය කිරීම සඳහා 2014 පළමු කාර්තුව තුළ පැවති දින 91 ක සහ 364 ක භාණ්ඩාගාර බිල්පත් සඳහා බරිත සාමාන්‍ය ඵලදා අනුපාතයන්, 2014 ජූලි 01 දින සිට නැවත දැනුම් දෙන තෙක් යොදා ගැනීමට තීරණය කරන ලදී.

**අනෙකුත්**

2014 ජනවාරි 01 - සංයුක්ත රක්ෂණ සමාගම් වෙන්කර හඳුනා ගැනීමේ කටයුත්තේ දී එක් වරක් පමණක් සිදු වූ ගනුදෙනුව අදාළ ව්‍යාපාරය අඛණ්ඩව පවත්වා ගෙන යාම ලෙස සැලකෙන අතර එම පදනම මත ජීවිත රක්ෂණ සහ සාමාන්‍ය රක්ෂණ සම්බන්ධයෙන් බදු උදාසීන තත්ත්වය සලසනු ඇත.

2014 ජනවාරි 02 - දිගුකාලීන සහ සාමාන්‍ය රක්ෂණ සමාගම්වල කටයුතු වෙන වෙනම පවත්වා ගෙන යාමට අදාළව ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය විසින් නිකුත් කළ මාර්ගෝපදේශයේ ඇතැම් නිර්ණායකවල අදාළත්වය සලකා බලා, රක්ෂණ සමාගමකට තවත් රක්ෂණ සමාගමක් සමඟ පොදුවේ යටිතල පහසුකම් භාවිතා කිරීමට අවසර දීමට තීරණය කරන ලදී.

2014 ජනවාරි 30 - එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනා සම්මුති අංක 1267 (1999) යටතේ ත්‍රස්තවාදය සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම වැළැක්වීම සහ මැඩපැවැත්වීම සඳහා වූ වගකීම් විස්තර කරමින් බලයලත් විදේශ මුදල් මාරු කරන්නන් වෙත චක්‍රලේඛයක් නිකුත් කරන ලදී.

2014 පෙබරවාරි 02 - දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය වෙන් වෙන්ව පවත්වා ගෙන යැමේ අවශ්‍යතාවට අනුගත වන ඕනෑම අලුතින් ආරම්භ කරන රක්ෂණ සමාගමකට, රක්ෂණ සමාගමක් ලෙස ලියාපදිංචි වීමේ දී, රුපියල් මිලියන 100 කට නොඅඩු ගෙවා නිමි ප්‍රාග්ධනයක් පවත්වා ගෙන යා හැකි වීමට සහ 2015 පෙබරවාරි 7 දිනට පෙර එම ප්‍රමාණය රුපියල් මිලියන 500 ක් දක්වා වැඩි කිරීමට ද, ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය විසින් නීති සංශෝධනය කරන ලදී.

| | |
|---|---|
| 2014 පෙබරවාරි 11 | - ලියාපදිංචි කල්බදු මූල්‍යකරණ ආයතනවලට අදාළ අයදුම් කිරීමේ, ලියාපදිංචි වීමේ සහ වාර්ෂික බලපත්‍ර ගාස්තු සංශෝධනය කරන ලදී. |
| 2014 අප්‍රේල් 10 | - ස්වයං රැකියා ප්‍රවර්ධන මූලාරම්භක ණය යෝජනා ක්‍රමය යටතේ සහභාගිත්ව මූල්‍ය ආයතන, ණයකරුවන්ට ලබා දෙන උප ණය සඳහා වන පොලී අනුපාතිකය සියයට 10 සිට සියයට 9 දක්වා අඩු කරන ලද අතර, උපරිම තනි පුද්ගල ණය ප්‍රමාණය රුපියල් 250,000 සිට රුපියල් 500,000 දක්වා ඉහළ නංවන ලදී. |
| 2014 අප්‍රේල් 11 | - ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ 2013 දෙසැම්බර් 12 සහ 2013 දෙසැම්බර් 27 දිනැති විධිවිධාන අනුව ලැයිස්තුගත සමාගම්වල අධ්‍යක්ෂවරුන් සහ විධායක නිලධාරීන්ගේ සම්බන්ධිත පාර්ශ්වයන් ආශ්‍රිත කටයුතු සහ ගණුදෙනු සම්බන්ධ කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත නීතිරීති සංශෝධනය කරන ලදී. |
| 2014 අප්‍රේල් 24 | - ලියාපදිංචිය අනුමත කරන ලද, දැනටමත් ව්‍යාපාර මෙහෙයුම් ආරම්භ නොකළ සියලු ලියාපදිංචි ආයෝජන කළමනාකරුවන්ට මාස 06 ක් තුළ එම ව්‍යාපාර මෙහෙයුම් ආරම්භ කිරීම සඳහා ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් නියෝගයන් නිකුත් කරන ලදී. |
| | - අවම මහජන කොටස් හිමිකාරිත්වය පවත්වා ගැනීම සඳහා SEC/LEG/13/12/37 විධිවිධානය යටතේ වන පොදු නිර්වචනය ප්‍රතිස්ථාපනය කිරීම සහ එය අන්තර්ගත කිරීම සඳහා ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් විධිවිධානයන් නිකුත් කරන ලදී. |
| 2014 ජුනි 06 | - නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේ වන බෝග සඳහා ලබා දෙන ණය මුදල් ප්‍රමාණයන් වැඩි කරන ලද අතර, ණයලාභියාගෙන් අය කරන වාර්ෂික පොලී අනුපාතිකය සහ රජය විසින් ගෙවනු ලබන වාර්ෂික පොලී සහනාධාර අනුපාතිකය පිළිවෙළින් සියයට 7 සහ සියයට 5 දක්වා අඩු කරන ලදී. |
| 2014 ජුනි 10 | - සියළු රක්ෂණ සමාගම් සහ රක්ෂණ තැරැව්කාර සමාගම් විසින් රක්ෂණ නියෝජිතයින් (පුද්ගලයන් හැර) පිළිබඳ ලැයිස්තුවක් පවත්වා ගෙන යාමේ අවශ්‍යතාවය දක්වමින් ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය විසින් චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. |
| 2014 ජුනි 25 | - එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනා සම්මුති අංක 1373 (2001) යටතේ ත්‍රස්තවාදය සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම වැළැක්වීම සහ මැඩපැවැත්වීම සම්බන්ධයෙන් වූ වගකීම් විස්තර කරමින් බලපත්‍රලාභී බැංකු සහ බලපත්‍රලාභී මුදල් සමාගම් වෙත චක්‍රලේඛයක් සහ විධිවිධාන නිකුත් කරන ලදී. |
| 2014 ජූලි 07 | - එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනා සම්මුති අංක 1373 (2001) යටතේ ත්‍රස්තවාදය සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම වැළැක්වීම සහ මැඩපැවැත්වීම සම්බන්ධයෙන් වූ වගකීම් විස්තර කරමින් රක්ෂණ සමාගම් වෙත චක්‍රලේඛයක් සහ විධිවිධාන නිකුත් කරන ලදී. |
| | - එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනා සම්මුති අංක 1373 (2001) යටතේ ත්‍රස්තවාදය සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම වැළැක්වීම සහ මැඩපැවැත්වීම සම්බන්ධයෙන් වූ වගකීම් විස්තර කරමින් කොටස් තැරැව්කරුවන් වෙත චක්‍රලේඛයක් සහ විධිවිධාන නිකුත් කරන ලදී. |
| 2014 ජූලි 17 | - පොලී සහනාධාර ණය යෝජනා ක්‍රමයක් වන මහා පරිමාණ කිරි නිෂ්පාදන සංවර්ධන ණය යෝජනා ක්‍රමය සඳහා සුදුසුකම් ලැබීමේ නිර්ණායකයක් වූ කිරි දෙනුන් 25 ක ගොවිපල විශාලත්වය කිරිදෙනුන් 7 ක ගොවිපල විශාලත්වයක් දක්වා අඩු කරන ලදී. |
| 2014 සැප්තැම්බර් 22 | - මහ බැංකුවේ මැදිහත් වීම මත සිදුවන මූල්‍ය ඒකාබද්ධකරණ වැඩසටහනට අයත් විෂය සීමාවට ඇතුළත් කොළඹ කොටස් හුවමාරුවේ කොටස් ගනුදෙනු ආශ්‍රිත සාකච්ඡා කළ ගනුදෙනු (Crossing Board) මත පනවනු ලැබූ මිල සංරෝධක භාවිතය ලිහිල් කිරීම සඳහා ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් විධිවිධානයක් නිකුත් කරන ලදී. |
| 2014 සැප්තැම්බර් 24 | - සෑම ඒකක භාර අරමුදලක් සඳහාම ඕනෑම අවස්ථාවක දී, ඒකක හිමිකරුවන් 50 දෙනෙකුගෙන් යුත් අවමයක් පවත්වා ගෙන යෑමටත්, ඒ ආශ්‍රිත වූ යම් යම් සීමා පැනවීමටත් අදාළ නව නියෝගයක් සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලදී. |
| 2014 ඔක්තෝබර් 16 | - නැගෙනහිර පළාත තුළ ආර්ථික කටයුතු නැවත ආරම්භ කිරීම සඳහා වන ණය යෝජනා ක්‍රමය අවසන් කරන ලදී. |

| | |
|---|---|
| 2014 ඔක්තෝබර් 25 | - විදේශිකයන්ට ඉඩම් විකිණීමේ දී සහ කල්බදු ක්‍රමයට පවරා දීමේ දී අදාළ නීති ඇතුළත් ඉඩම් සන්තකය පැවරීම සීමා කිරීමේ පනත බලාත්මක කරන ලදී. |
| 2014 නොවැම්බර් 05 | - සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය යටතේ සහභාගිත්ව මූල්‍ය ආයතන මගින් ණයකරුවන් වෙත ලබා දෙන ණය සඳහා වන වාර්ෂික පොලී අනුපාතිකය සියයට 9 සිට සියයට 8 දක්වා අඩු කරන ලදී. |
| 2014 නොවැම්බර් 18 | - සියලුම රක්ෂණ සමාගම් සහ රක්ෂණ තැරැව්කරුවන්ට ඔවුන්ගේ බොහොමයක් රක්ෂණ නියෝජිතයන් (පුද්ගලයන් හැර) සම්බන්ධයෙන් අවශ්‍යයෙන්ම සිදු කළ යුතු සමහරක් බැඳීම් පිළිබඳව ලිඛිත ගිවිසුමකට එළඹෙන ලෙස ඉල්ලමින් ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය විසින් නව විධිවිධානයක් නිකුත් කරන ලදී. |
| 2014 දෙසැම්බර් 03 | - මහා පරිමාණ කිරි නිෂ්පාදන සංවර්ධන ණය යෝජනා ක්‍රමය යටතේ ණයකරුවන්ගෙන් අය කරන වාර්ෂික පොලී අනුපාතිකය සියයට 8 සිට සියයට 6 දක්වා අඩු කරන ලදී. |
| 2014 දෙසැම්බර් 23 | - මූලික මහජන නිකුතුවක් මාර්ගයෙන් කොටස් ලැයිස්තුගත කිරීමට අපේක්ෂා කරන සමාගම්, සිය සංස්ථා ප්‍රකාශනයේ සඳහන් අර්පණ මිල පදනම් වන කරුණු පිළිබඳ අනාවරණය කිරීමට නියෝග කරමින් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් විධිවිධානයක් නිකුත් කරන ලදී. |
| 2014 දෙසැම්බර් 31 | - ලැයිස්තුගත ණය සුරැකුම්පත් සම්බන්ධයෙන් ශ්‍රේණිගත කිරීමේ අවශ්‍යතාවන්ට අදාළව කොළඹ කොටස් හුවමාරුව විසින් චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. |